අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2008 අගෝස්තු

G. C. E. (Adv. Level) Examination, August 2008

කෘෂි විද්‍යාව I - පැය දෙකයි

Agricultural Science I - Two hours

ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

සැලකිය යුතුයි :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිලිමත් ව කියවන්න.
- අංක 1 සිට 60 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.

---

1. පාසල් කාලගුණික මධ්‍යස්ථානයේ දී සාපේක්ෂ ආර්ද්‍රතාව මනිනු ලබන්නේ
(1) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානයකිනි. (2) වාෂ්පීකරණ තැටියකිනි. (3) පීඩනමානයකිනි.
(4) pH මීටරයකිනි. (5) ආතතිමානයකිනි.

2. ජල චක්‍රයට අවම බලපෑමක් ඇති කරනුයේ
(1) මුහුදු ජලයයි. (2) භූගත ජලයයි. (3) වායුගෝලයේ ජලවාෂ්පයි
(4) ග්ලැසියරයි. (5) මතුපිට ඇති මිරිදියයි.

3. පසක සාමාන්‍ය සත්‍ය ඝනත්වය ආසන්න වශයෙන්
(1) $0.9\ g/cm^3$ කි. (2) $1.2\ g/cm^3$ කි. (3) $1.7\ g/cm^3$ කි.
(4) $2.2\ g/cm^3$ කි. (5) $2.6\ g/cm^3$ කි.

4. සංකීර්ණ ආමාශයේ විශාලතම කුටීරය
(1) රූමනයයි. (2) විතංශිකාවයි. (3) බහුනැමියයි. (4) ජඨරාශයයි. (5) අන්නස්‍රෝත ඇලියයි.

5. බීජ, ජලය අවශෝෂණය කරනු ලබන්නේ
(1) බීජාග්‍රපයෙනි (2) බීජ මූලයෙනි (3) බීජ ලපයෙනි (4) සේවනියෙනි (5) අනුද්වාරයෙනි.

6. ශාකයකට ලබාගත හැකි ජලය ලෙස සලකනු ලබන්නේ
(1) ජලාකර්ෂක ජලයයි. (2) කේශාකර්ෂණ ජලයයි. (3) ගුරුත්වාකර්ෂණ ජලයයි.
(4) නිදහස් ජලයයි. (5) අතිරික්ත ජලයයි.

7. ගංගා නිම්නයක දක්නට ලැබෙන ප්‍රධාන පස් කාණ්ඩය
(1) රෙගොසෝල් වේ. (2) ලවණ පස් වේ. (3) වගුරු පස් වේ.
(4) ඇලුවියල් පස් වේ. (5) ක්ෂාරීය පස් වේ.

8. මනුෂ්‍යයින්ට ඉතාමත් අත්‍යවශ්‍ය මේද අම්ලය වනුයේ
(1) ස්ටියරික් අම්ලයයි. (2) පාමටික් අම්ලයයි. (3) ලිනොලෙයික් අම්ලයයි.
(4) පයිරුවික් අම්ලයයි. (5) ලෝරික් අම්ලයයි.

9. කෘෂිකාර්මික කාලගුණික මධ්‍යස්ථානයක දී ආලෝකයේ තීව්‍රතාව මනිනු ලබන්නේ
(1) සූර්ය විකිරණමානයෙනි. (2) අනිලමානයෙනි (3) උෂ්ණත්වමානයෙනි.
(4) ස්ටීවන්සන්ගේ කුටීරයෙනි. (5) සූර්ය දීප්ත රෙකෝඩරයෙනි.

10. 2007 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයට (GDP) 2002 සහතික මිල අනුව කෘෂිකාර්මික අංශයෙන් ලැබූ දායකත්වය ආසන්න වශයෙන්
(1) 8% කි. (2) 10% කි. (3) 12% කි. (4) 14% කි. (5) 16% කි.

11. වියළි කලාපයේ පස්වල රතු වර්ණය බොහෝවිට ඇතිවන්නේ
(1) යකඩ ඔක්සයිඩ නිසා ය. (2) කෙඔලිනයිට් ඛනිජ නිසා ය. (3) සිලිකේට් ඛනිජ නිසා ය.
(4) අධික මැටි ප්‍රමාණය නිසා ය. (5) බොරලු නිසා ය.

12. ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ බිංදු ජල තාක්ෂණය යටතේ වගා කිරීමට ඉතාමත් සුදුසු බෝගයක් වනුයේ
(1) වී ය. (2) තල ය. (3) මෑණු ය. (4) මෙනේරි ය. (5) අන්නාසි ය.

13. ආම්ලික පසෙහි වඩාත් ම ලබාගත නොහැකි ක්ෂුද්‍ර මූලද්‍රව්‍යය වනුයේ
(1) Fe ය. (2) Cu ය. (3) Mo ය. (4) Zn ය. (5) B ය.

www.apepanthiya.lk

14. ආහාර ගන්නා අතරතුර දී ශාකවලට වයිරස් සහ බැක්ටීරියා බෝකරන කෘමීන් වන්නේ
(1) දළඹුවන් ය. (2) කුඩිත්තන් ය. (3) කුරුම්භියන් ය. (4) සලබයන් ය. (5) මකුළුවන් ය.

15. ප්‍රභාසංශ්ලේෂණය සඳහා වන සක්‍රිය කිරණවල තරංග ආයාමය (wave length)
(1) 250 - 600 nm වේ. (2) 300 - 800 nm වේ. (3) 400 - 700 nm වේ.
(4) 300 - 1000 nm වේ. (5) 250 - 1000 nm වේ.

16. සයිලේජ් සෑදීම යනු
(1) තෙත් ආකාරයෙන් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.
(2) වියළි ආකාරයෙන් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.
(3) කෘත්‍රිම ද්‍රව්‍ය එකතු කිරීම මගින් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.
(4) කිරි ගවයින් සඳහා පිළියෙල කරන විශේෂ ආහාරයකි.
(5) ගව නැම්බියන් සඳහා පිළියෙල කරන සමතුලිත ආහාරයකි.

17. "හරිතාගාර ආවරණයට" දයක වන වායු වන්නේ
(1) N_2 හා CO_2 ය. (2) N_2 හා He ය. (3) H_2 හා He ය.
(4) CO_2 හා CH_4 ය. (5) CH_4 හා N_2 ය.

18. ගොවිපොළ සතුන්ගේ වර්ධනය සහ නිෂ්පාදනය කෙරෙහි බලපාන වඩාත් වැදගත් පාරිසරික සාධකය
(1) පරිසර උෂ්ණත්වයයි. (2) සාපේක්ෂ ආර්ද්‍රතාවයි. (3) දිවා කාලයේ දිගයි.
(4) සුළඟේ දිශාවයි. (5) වර්ෂාපතනය සහ එහි ව්‍යාප්තියයි.

19. වැඩිම කාබන් : නයිට්‍රජන් අනුපාතය වාර්තා වන්නේ
(1) තෘණවල ය. (2) පන් වර්ගවල ය. (3) පිදුරුවල ය.
(4) පොල් ලෙලිවල ය. (5) ග්ලිරිසිඩියා පත්‍රවල ය.

20. ගොඩබිම්වල බිම් සැකසීමේ පරමාර්ථයක් වනුයේ
(1) පසේ වර්ණය වෙනස් කිරීමයි. (2) පසේ ප්‍රතිරෝධීතාව වැඩි කිරීමයි.
(3) පාංශු අංශු ඝනත්වය අඩු කිරීමයි. (4) පසේ වයනය වෙනස් කිරීමයි.
(5) පසේ දෘශ්‍ය ඝනත්වය අඩු කිරීමයි.

21. ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල වාර්ෂික සහල් පරිභෝජනය ආසන්න වශයෙන්
(1) 50 kg වේ. (2) 100 kg වේ. (3) 150 kg වේ. (4) 200 kg වේ. (5) 250 kg වේ.

22. අවධි දිවා දිගට වඩා දිවා කාලය දිග වැඩි වූ විට දිගු දින ශාකවල
(1) පත්‍ර පතනය ඇරඹේ. (2) අතු බෙදීම් ඇරඹේ. (3) සංසේචනය ඇරඹේ.
(4) පරාගනය ඇරඹේ. (5) පුෂ්පීකරණය ඇරඹේ.

23. සංසේචනයෙන් තොරව ඵල හටගැනීම හඳුන්වනුයේ
(1) බහුයෝගිතාව (polygamy) ලෙස ය. (2) පාතනෝඵලනය (parthenocarpy) ලෙස ය.
(3) ජලාබුජතාව (viviparity) ලෙස ය. (4) විසංයෝගතාව (apomixis) ලෙස ය.
(5) නිමලයෝගිතාව (cleistogamy) ලෙස ය.

24. කෘෂි නිෂ්පාදනය සඳහා සම්පත් ප්‍රශස්ත ලෙස යොදා ගන්නා වගා ක්‍රමයක් වනුයේ
(1) බෝග මාරුවයි. (2) උඩු වගාවයි (over-cropping) (3) පුරන් කිරීමයි (fallowing)
(4) අවම බිම් සැකසීමයි. (5) සංරක්ෂණ බිම් සැකසීමයි.

25. ට්‍රයිග්ලිසරයිඩ ව්‍යුත්පන්න වන්නේ
(1) ග්ලයිකොජන් + ඇමයිනෝ අම්ල මගිනි. (2) ග්ලයිකොජන් + සිට්‍රික් අම්ල මගිනි.
(3) ග්ලූකෝස් + මේද අම්ල මගිනි. (4) ග්ලිසරෝල් + මේද අම්ල මගිනි.
(5) ග්ලිසරෝල් + ග්ලූකෝස් මගිනි.

26. පාංශු වයනය යනු
(1) මතුපිට පසේ ඛනිජ අංශුවල සාපේක්ෂ ව්‍යාප්තියයි.
(2) පසක රොන්මඩ, මැටි සහ වැලි අංශුවල අනුපාතයයි.
(3) පසක වැලි, රොන්මඩ සහ මැටි අංශුවල සාපේක්ෂ ප්‍රතිශත ව්‍යාප්තියයි.
(4) පසක මැටි, රොන්මඩ සහ කාබනික ද්‍රව්‍යවල ප්‍රතිශත ව්‍යාප්තියයි.
(5) පසක ඛනිජ අංශුවල ප්‍රතිශත ව්‍යාප්තියයි.

27. පහත දක්වෙනුයේ පාෂාණ පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.
A - ආග්නේය පාෂාණ මැග්මා ඝන වීමෙන් සෑදේ.
B - විපරීත පාෂාණ සෑදීමට ජලය සහ සුළඟ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරයි.
C - ආග්නේය සහ විපරීත පාෂාණවල අවසාදිතවලින් අවසාදිත පාෂාණ සෑදේ.
D - ලාවා ඝන වී විපරීත පාෂාණ සෑදේ.

www.apepantiya.lk

ඉහත දී ඇති ප්‍රකාශවලින් ඉතාම නිවැරදි ප්‍රකාශ වනුයේ
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) C සහ D පමණි.

28. ගොවියෙක් තමන්ගේ ක්ෂේත්‍රයෙහි සිට්‍රස් හා කෝපි ශාකවල සෙව්වන්දියක ආකාරයට සකස් වූ පත්‍රත්, තේ ශාකවල දෑකැති හැඩය ගත් පත්‍රත් නිරීක්ෂණය කළේ ය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුව විය හැක්කේ
(1) B ඌනතාවයි. (2) Zn ඌනතාවයි. (3) Mo ඌනතාවයි.
(4) Ca ඌනතාවයි. (5) N ඌනතාවයි.

29. බෑගයක් තුළ රතු පැහැති ඇපල් ගෙඩි 8 ක් ද, කොළ පැහැති ඇපල් ගෙඩි 6 ක් ද, කහ පැහැති ඇපල් ගෙඩි 4 ක් ද දමා ඇත. බෑගය තුළින් අහඹු ලෙස ඇපල් ගෙඩියක් පිටතට ගන්නා ලදී. මෙලෙස ගත් ඇපල් ගෙඩිය රතු හෝ කොළ පැහැති වීමට ඇති සම්භාවිතාව කුමක් ද?
(1) $\frac{7}{9}$ (2) $\frac{8}{9}$ (3) $\frac{6}{9}$ (4) $\frac{4}{9}$ (5) $\frac{2}{9}$

30. ගොවියකුට හෙක්ටාර එකකට බඩඉරිඟු පැළ 55 000 ක් අවශ්‍ය විය. ඔහුගේ බීජ මියයෑමේ ශීඝ්‍රතාව (seed mortality rate) 5% ක් නම්, හෙක්ටාරයක බිමකට අවශ්‍ය බීජ සංඛ්‍යාව
(1) 77 500 වේ. (2) 67 750 වේ. (3) 62 500 වේ. (4) 60 750 වේ. (5) 57 750 වේ.

31. ක්ෂුද්‍ර ප්‍රචාරණය
(1) අනෙකුත් ප්‍රකට ප්‍රචාරණ ක්‍රමවලට වඩා වියදම අඩු ය. (2) දෛහික ක්ලෝන විචලතාව දක්වයි.
(3) කුඩා බීජ සහිත බෝග ප්‍රචාරණය සඳහා වඩාත් සුදුසු ය. (4) සඳහා විශාල වශයෙන් ශ්‍රමය අවශ්‍ය වේ.
(5) වෛරස රහිත රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා භාවිත වේ.

32. ශාකවල ද්විගෘහිතාව අනුවර්තනය වී ඇත්තේ
(1) පරපරාගණය සඳහා ය. (2) අලිංගික ප්‍රජනනය සඳහා ය. (3) කෘමි පරාගණය සඳහා ය.
(4) ස්වපරාගණය සඳහා ය. (5) ස්වාභිජනනය සඳහා ය.

33. පහත සඳහන් ඒ අතුරෙන් ළමුන් සඳහා පමණක් අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ලය වනුයේ
(1) හිස්ටිඩීන් ය. (2) ට්‍රිප්ටොෆෑන් ය. (3) ත්‍රියොනීන් ය. (4) ලයිසීන් ය. (5) මෙතියොනීන් ය.

34. ඌරු පට්ටියක සිටින ඊරියන් රැළක් 2008 මාර්තු 01 ද කෘත්‍රිම සිංචනය මගින් ගැබ් ගන්වන ලදී. උන්ගෙන් වැඩි සංඛ්‍යාවක් පැටවුන් බිහිකරනු ඇත්තේ
(1) 2008. මැයි 22 ද ය. (2) 2008 ජූනි 22 ද ය. (3) 2008 ජූලි 22 ද ය.
(4) 2008 අගෝස්තු 22 ද ය. (5) 2008 සැප්තැම්බර් 22 ද ය.

35. ගොවියකු විසින් රුපියල් මිලියන 1.2 ක් වැයකර අලුත් ට්‍රැක්ටරයක් මිල දී ගෙන වසර 20 ක් භාවිත කිරීමෙන් පසුව එහි අබලි වටිනාකම රුපියල් 60 000 ක් විය. ට්‍රැක්ටරය හිමිකාරත්වය පළමු වසර තුළ දරන සෘජු රේඛීය ක්ෂය වීම වනුයේ
(1) රුපියල් 1 000 කි. (2) රුපියල් 1 500 කි. (3) රුපියල් 2 000 කි.
(4) රුපියල් 2 500 කි. (5) රුපියල් 3 000 කි.

36. වැලිමය පසක ජලය රඳවා ගැනීමේ හැකියාව වැඩි වනුයේ
(1) පසට මැටි එක් කිරීමෙනි. (2) පස ක්ෂේත්‍ර ධාරිතාවෙන් 50% වන තෙක් වියළීමෙනි.
(3) පස හෑමෙන් හා පෝරු ගෑමෙනි. (4) රෝලක් භාවිතයෙන් පස තද කිරීමෙනි.
(5) පස මඩ කර පසුව වියළීමට හැරීමෙනි.

37. අර්ධ ජලජ, ආක්‍රමණික ශාකයකට උදාහරණයකි,
(1) *Salvinia molesta* (2) *Eichhornia crassipes* (3) *Pistia staratiotes*
(4) *Mimosa pigra* (5) *Lantana camara*

38.. ලණු ගෘහ (lath houses) ප්‍රධාන වශයෙන් භාවිත කෙරෙන්නේ
(1) විශාල බීජ ප්‍රරෝහණය කිරීමට ය.
(2) රෝග සහ පළිබෝධවලින් ආරක්ෂා කර ගැනීමට ය.
(3) කැපූ මල් කර්මාන්තයේ දී මල් පිපීම ආරම්භ කිරීමට ය.
(4) දඬු කැබලිවලින් මුල් ඇද්දවීම පිණිස ය.
(5) පත්‍රමය ශාක (foliage plants) පුහුණු කිරීමට ය.

39. වී වගාවේ පසු අස්වනු හානි අඩු කිරීම සඳහා
(1) වී ඇට මේරීමට පෙර අස්වනු නෙලිය යුතු ය.
(2) වර්ෂා කාලයේ අවසානයට පෙර අස්වනු නෙලිය යුතු ය.
(3) නෙලාගත් වී අස්වැන්න නිසියාකාරව පිරිසිදු කළ යුතු ය.
(4) අස්වනු නෙලන අවස්ථාවේ දී වී ඇටවල තෙතමන ප්‍රමාණය 13% ක් පමණ විය යුතු ය
(5) කපාගත් ගොයම් පෑගීමට පෙර පැය 24 ක් ගොඩගසා තැබිය යුතු ය.

www.pastpapers.wiki / pastpanthiya.lk

40. සත්ත්ව ආහාරවල අඩංගු ශක්ති පරිපූරකවලට උදහරණයක් වන්නේ
(1) මත්ස්‍ය අන්නය, මස් අන්නය සහ රුධිර අන්නය ය.
(2) බඩ ඉරිඟු ඇට, සහල් නිවුඩු සහ පොල් තෙල් ය.
(3) තිරිඟු පිටි, මොලෑසස් සහ සෝයා අන්නය ය.
(4) මඤ්ඤොක්කා අල, තල පුන්නක්කු සහ සුනුසහල් ය.
(5) තිරිඟු කුඩු, සත්ත්ව තෙල් සහ කුකුළු අතුරුඑල අන්නය ය.

41. රෝමාන්තිකයකුගේ රූමනය තුළ අධික ලෙස වාතය එක්රැස්වීම නිසා හටගන්නා රෝගී තත්ත්වය නම්,
(1) ඇගලැක්ටියයි (agalactia) (2) පිපුමයි (bloat) (3) කුර සහ මුඛ රෝගයයි.
(4) බෝවයින් ප්ලූරොනියුමෝනියාවයි (bovine pleuropneumonia) (5) කිරි උණයි (grass tetany)

42. ලාභ හා අලාභ ගිණුම සකසනු ලබන්නේ
(1) යම් නියත දිනයකට ය. (2) වසරකට ය. (3) යම් නිශ්චිත කාලයකට ය.
(4) යම් නියත දිනකට, වසර අවසාන කාලයේ දී ය. (5) වසර අවසානයේ දී ය.

43. ආහාරවලට ප්‍රති-ඔක්සිකාරක එකතු කරනු ලබන්නේ,
(1) ජලය සහ විටමින් නැතිවීම වළක්වා ගැනීමට ය.
(2) විටමින් සහ එන්සයිම නැතිවීම වළක්වා ගැනීමට ය.
(3) දුර්වර්ණ වීම සහ එන්සයිම ක්‍රියාකාරිත්වය වළක්වා ගැනීමට ය.
(4) මුඩුවීම සහ එන්සයිම ක්‍රියාකාරිත්වය නැතිවීම වළක්වා ගැනීමට ය.
(5) මුඩුවීම සහ දුර්වර්ණ වීම වළක්වා ගැනීමට ය.

44. බිම් සැකසීමේ දී තැටි නගුල භාවිතයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ
(1) පස පෙරලීම, වාතනය දියුණු කිරීම හා වල් පැළ පාලනයයි.
(2) කුඩා පස් අංශු ලබා ගැනීම, තද ස්ථරය සෑදීම හා වාතනය දියුණු කිරීමයි.
(3) කුඩා පස් අංශු ලබා ගැනීම හා වල් පැළ පාලනයයි.
(4) ජලවහනය දියුණු කිරීම හා සියුම් අංශුවලින් යුත් පාත්තියක් ලබා ගැනීමයි.
(5) රෝග හා පළිබෝධ පාලනය හා සියුම් අංශුවලින් යුත් පාත්තියක් ලබා ගැනීමයි.

45. ද්විබීජපත්‍රී බීජ සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක් ද?
(1) එලාවරණ බීජවලට තදින් සම්බන්ධ වී ඇත. (2) බීජපත්‍ර වර්ජිකාව ලෙස හැඳින්වේ.
(3) බීජ ලපය හා අනුද්වාරය දක්නට නැත. (4) බීජපත්‍ර අල්ප විකසිත පටකයක් බවට පත්වී ඇත.
(5) පරිණත බීජයක භ්‍රෑණපෝෂය දක්නට නැත.

46. අඩු සාපේක්ෂ ආර්ද්‍රතාවක් සහිත ප්‍රදේශයක සිටින ගොවියෙක් තම ගෙවත්තෙහි වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාවක් යටතේ වැවෙන බෝගයක් වගා කිරීමට අපේක්ෂා කරයි. ඔහුගේ වගාවට වඩාත් සුදුසු වන්නේ
(1) දැල් ගෘහයකි (net house). (2) වර්ධන මලු (grow bags) ය.
(3) එල්ලෙන පෝච්චි (hanging pots) ය. (4) පොලිතීන් නළ (poly tunnels) ය.
(5) උණුසුම් පාත්ති (hot beds) ය.

47. බස්නාහිර පළාතේ කුකුළු ගොවියෙක් ඔහුගේ ගොවිපොළෙහි බිත්තර නිෂ්පාදනය දෙසැම්බර් හා ජනවාරි මාසවලදී තරමක් අඩුවන බව නිරීක්ෂණය කළේ ය. මීට ප්‍රධාන හේතුව විය හැක්කේ
(1) එම කාලයේ පවතින සිසිල් දේශගුණයයි.
(2) එම කාලයේ පවතින කෙටි දිවා කාලයයි.
(3) එම මාසවල පවතින වියළි කාලගුණික තත්ත්වයයි.
(4) උත්සව කාලවල දී අධික ආලෝකකරණයයි. (illumination)
(5) එම කාලයේ පවතින ශබ්ද දූෂණය නිසා සතුන් තැති ගැනීමයි.

- අංක 48 සහ 49 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් රෝග සැලකිල්ලට ගන්න.

A - නිව්කාසල් (රානිකට්) රෝගය B - කුකුළු වසූරිය C - පුල්ලෝරම් රෝගය
D - කොක්සිඩියෝසිස් රෝගය E - කුරුළු උණ රෝගය

48. ඉහත රෝග අතුරෙන් වෛරස් මගින් ඇතිවන රෝග වනුයේ,
(1) A, B සහ C පමණි. (2) A, B සහ E පමණි. (3) B, C සහ D පමණි.
(4) B, C සහ E පමණි. (5) C, D සහ E පමණි.

49. ඉහත රෝග අතුරෙන් ප්‍රොටසෝවා හේතුවෙන් ඇතිවන රෝගය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය.

www.apepanthiya.lk

50. ශ්‍රී ලංකාවේ බහුලව වගා කෙරෙන බෝග කිහිපයක් පහත දක්වේ.
A - වී B - බඩඉරිඟු C - කුරක්කන් D - උක්

ඉහත බෝග අතුරෙන් C_3 කාණ්ඩයට අයත් බෝග වන්නේ
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) B සහ D පමණි.

51. කුකුළු පාලනයට සම්බන්ධ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දක්වේ.
A - සතුන්ට ආහාර හා ජලය සැපයීම.
B - අභිජනනය සහ නව ප්‍රභේද නිපදවීම.
C - මනා සෞඛ්‍යාරක්ෂක තත්ත්ව සැපයීම.
D - රෝග වළක්වා ගැනීම.

ඉහත ක්‍රියාකාරකම් අතුරෙන් වාණිජ කුකුළු ගොවිපොළක එදිනෙදා කටයුතුවලට ඇතුළත්වන්නේ
(1) A, B සහ C පමණි. (2) A, B සහ D පමණි. (3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි. (5) A, B, C සහ D යන සියල්ල ම ය.

52. පහත දක්වෙන්නේ ගොවිපොළ සතුන්ගේ දැකිය හැකි හෝර්මෝන වර්ග කිහිපයකි.
A - ඊස්ට්‍රජන්
B - ප්‍රොජෙස්ටරෝන්
C - ලුටිනීකරණ හෝර්මෝනය (LH)
D - ස්‍යුනිකා උත්තේජන හෝර්මෝනය (FSH - Follicle Stimulating Hormone)
E - ඇඩ්‍රිනලින්

ඉහත හෝර්මෝන අතුරෙන්, එළදෙනකගේ මද චක්‍රය කෙරෙහි බලපාන හෝර්මෝන වන්නේ
(1) A, B, C සහ D පමණි. (2) A, B, C සහ E පමණි. (3) A, B, D සහ E පමණි.
(4) A, C, D සහ E පමණි. (5) B, C, D සහ E පමණි.

53. සිසුවකු විසින් ගොවිපොළක එක්තරා බෝග විශේෂයක එක් ශාකයක පමණක් බීජ රහිත විශාල ඵල හටගන්නා බවත්, එම විශේෂයේම අනෙක් ශාකවල බීජ සහිත සාමාන්‍ය ප්‍රමාණයේ ඵල හටගන්නා බවත් නිරීක්ෂණය කරන ලදී. මෙය
(1) ඒකගුණ ශාකයක් විය හැකිය. (2) ද්විගුණ ශාකයක් විය හැකිය.
(3) ත්‍රිගුණ ශාකයක් විය හැකිය. (4) චතුර්ගුණ ශාකයක් විය හැකිය.
(5) උභය ද්විගුණ ශාකයක් විය හැකිය.

54. ශ්‍රී ලංකාවේ එළවලු පසු අස්වනු හානිය පිළිබඳ වඩාත් නිවැරදි වගන්තිය තෝරන්න.
(1) අස්වනු නෙලීමෙන් පසු කෙටි කාලයක් තුළ දී පරිභෝජනයට ගන්නා බැවින් එළවලු පසු අස්වනු හානිය එතරම් සැලකිය යුතු නැත.
(2) එළවලු පසු අස්වනු හානියට ප්‍රධාන හේතුව ඒවා ක්ෂේත්‍රයේ සිට වෙළෙඳපොළට ප්‍රවාහනය කිරීමේ දී නොසැලකිලිමත් වීමයි.
(3) එළවලු ඉතා ඉක්මනින් නරක්වන සුළු බැවින් පසු අස්වනු හානි අඩු කිරීම අපහසු ය.
(4) ධාන්‍ය සමග සැසඳීමේ දී එළවලු පසු අස්වනු හානි අඩු ය.
(5) එළවලු පසු අස්වනු හානිය කෙරෙහි පෙර අස්වනු රෝග හා පළිබෝධ පාලනයේ කිසිම බලපෑමක් නැත.

www.pastpapers.wiki / www.sepaerathiva.lk

55. ගොවියකු භාවිත කළ වල්නාශකයක පහත සඳහන් ගති ලක්ෂණ තිබිණි.
A - තෘණ පාලනය කරයි.
B - පත්‍ර මගින් උරා ගනී.
C - වල් නාශකයක යොද සති දෙකකට පසු එහි ක්‍රියාකාරිත්වයේ ලක්ෂණ දැකිය හැකි ය.

ඉහත සඳහන් තොරතුරුවලට අනුව මෙය
(1) තෝරා තෘණ වර්ග මර්දනය කරන, පූර්ව නිර්ගමන, ස්පර්ශ වල්නාශකයකි.
(2) තෝරා තෘණ වර්ග මර්දනය කරන, පූර්ව නිර්ගමන, සංස්ථානික වල්නාශකයකි.
(3) තෝරා නසන, පසු නිර්ගමන, ස්පර්ශ වල්නාශකයකි.
(4) තෝරා නසන, පසු නිර්ගමන, සංස්ථානික වල්නාශකයකි.
(5) තෝරා නසන, පත්‍ර මත යොදන (foliar applied), ස්පර්ශ වල්නාශකයකි.

56. බීජ සුප්තතාව වඩාත් හොඳින් නිර්වචනය වනුයේ,
(1) ප්‍රරෝහණය සඳහා යහපත් පරිසර තත්ත්ව ලැබෙන තෙක් ප්‍රරෝහණය නොවන ජීව්‍ය බීජ ලෙස ය.
(2) ප්‍රරෝහණය සඳහා යහපත් තත්ත්ව ලැබුණ ද ප්‍රරෝහණය නොවන ජීව්‍ය බීජ ලෙස ය.
(3) තද බීජාවරණය නිසා ප්‍රරෝහණය නොවන ජීව්‍ය බීජ ලෙස ය.
(4) බීජ සීරීමෙන් පසුව පමණක් ප්‍රරෝහණය වන ජීව්‍ය බීජ ලෙස ය.
(5) ජලයේ පෙඟවීමෙන් පසුව පමණක් ප්‍රරෝහණය වන ජීව්‍ය බීජ ලෙස ය.

57. කෘෂිකර්මය කෙරෙහි පරිසරයේ බලපෑම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - උච්චත්වය වැඩිවීම සමග පරිසරයේ උෂ්ණත්වය අඩුවන බැවින් කඳුකර ප්‍රදේශවල සෞම්‍ය කලාපික බෝග වැවිය හැකිය.
B - සුළඟේ වේගය 8 km/h ට වැඩි ස්ථානවල සාර්ථක බෝග වගාවක් සඳහා සුළං බාධක අවශ්‍ය වේ.
C - බෝග ජල අවශ්‍යතාව කෙරෙහි පරිසරයේ සාපේක්ෂ ආර්ද්‍රතාව සැලකිය යුතු බලපෑමක් නොකරයි.

ඉහත දී ඇති ප්‍රකාශ වලින් වඩාත් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ
(1) A පමණි. (2) A සහ B පමණි. (3) A සහ C පමණි.
(4) B සහ C පමණි. (5) A, B සහ C යන සියල්ල ම ය.

58. වැපිරීමට පෙර වී බීජ පෙඟවීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. බීජ පෙඟවීමෙන්
A - බීජ පෙඟවීමෙන් ප්‍රරෝහණයට පෙර බීජයට ජලය අවශෝෂණය කර ගැනීම පහසු වේ.
B - බිත්තර වීවලින් හිස් බීජ ඉවත් කිරීමට බීජ පෙඟවීම උපකාරී වේ.
C - බීජ පෙඟවීම මගින් නිර්වායු තත්ත්ව ලබාදීමෙන් බීජවල සිටින ක්ෂුද්‍රජීවීන් විනාශ වේ.
D - බීජ පෙඟවීම බිත්තර වීවලින් අපිරිසිදු ද ඉවත් කිරීමට උපකාරී වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) B සහ D පමණි.

- අංක 59 ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පහත රූපය උපයෝගී කර ගන්න.



www.apepanthiya.lk

59. ඉහත රූපයේ දක්වා ඇති තත්ත්වය වඩාත් හොඳින් විස්තර කරන්නේ පහත සඳහන් කුමන වගන්තිය ද?
(1) *A* යනු ශාක ප්‍රරෝහයකි, *B* යනු ශාක මුලකි. (2) *A* සහ *B* යන දෙක ම ශාකයක මුල් ය.
(3) *A* සහ *B* යන දෙක ම ශාක ප්‍රරෝහ වේ. (4) *A* සහ *B* යන දෙක ම ශාක කොටස් වේ.
(5) *A* යනු ශාක මුලකි, *B* යනු ශාක ප්‍රරෝහයකි.

60. කතිපයාධිකාරය (oligopoly) හොඳින්ම පැහැදිලි කළ හැක්කේ,
(1) නිෂ්පාදකයින් රැසක්, මිල සම්මුතියක්, වෙළෙඳපොළට ඇතුළු වීමට බාධා හා නිෂ්පාදකයින් අතර තරඟකාරීත්වයක් පැවතීම ලෙස ය.
(2) නිෂ්පාදකයින් සුළු පිරිසක්, භාණ්ඩ විභේදනයක්, නිෂ්පාදකයින් අතර තරඟකාරීත්වයක් හා වෙළෙඳපොළට ඇතුළුවීමට බාධා පැවතීම ලෙස ය.
(3) නිශ්චිත මිලක්, එක් නිෂ්පාදකයෙක් භාණ්ඩ විභේදනයක් හා වෙළෙඳපොළට ඇතුළුවීමට බාධා පැවතීම ලෙසය.
(4) පාරිභෝගිකයින් රැසක්, නිෂ්පාදකයින් රැසක්, නිදහස් මිල විචලනයක් හා ලාභාංශ රැසක් පැවතීම ලෙස ය.
(5) නිශ්චිත මිලක්, නිෂ්පාදකයින් සුළු පිරිසක්, භාණ්ඩ සීමාසහිත ප්‍රමාණයක් හා නිෂ්පාදකයින් අතර තරඟකාරීත්වයක් පැවතීම ලෙස ය.

* * *

කෘෂි විද්‍යාව II - පැය තුනයි

වැදගත් :	☆	මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යන කොටස් දෙකකින් යුක්ත වේ. කොටස් දෙකට ම නියමිත කාලය පැ තුනකි.

A කොටස - ව්‍යුහගත රචනා

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු, මෙම පත්‍රයේ ම සපයන්න. ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

B කොටස - රචනා

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු "A" සහ "B" කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ "A" කොටස උඩින් තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාර දෙන්න.

ප්‍රශ්න පත්‍රයේ "B" කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

A කොටස - ව්‍යුහගත රචනා

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 10 කි.)

1. (*a*) (i) පාංශු pH අගය අර්ථ දක්වන්න.

....

....

(ii) පාංශු ආම්ලිකතාව අඩු කිරීමට යොදගත හැකි හුනුමය ද්‍රව්‍ය තුනක් ඒවායේ රසායනික සමීකරණ ද සමග නම් කරන්න.

	හුනුමය ද්‍රව්‍යයේ නම	රසායනික සමීකරණය
(1)	....	....
(2)	....	....
(3)	....	....

www.apepanthiya.lk

(iii) ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය පස් සඳහා ඇමෝනියම් සල්ෆේට් වෙනුවට යූරියා නිර්දේශ කිරීමට හේතු වන ප්‍රධාන කරුණක් සඳහන් කරන්න.

....

(iv) බෝග වගාව සඳහා වඩාත් ම උචිත pH පරාසය කුමක් ද?

....

(v) පාංශු pH අගය නිර්ණය කිරීමට යෝග්‍ය ක්‍රමයක් නම් කරන්න.

....

(*b*) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවියකු තම හෙක්ටයාර 1.6 ක් වන උස්බිම හා හෙක්ටයාර 3.0 වන පහත් බිම මහ කන්නය සඳහා වගා කිරීමට බලාපොරොත්තු වේ.

(i) ඔහු උස් බිමෙහි මිරිස් වගා කිරීමට සැලසුම් කරයි. එහෙත් ඉඩමේ භූ විෂමතාව නිසා වාරි ජලය ලබාගත හැක්කේ උස් බිමෙන් අඩකට පමණි. ඒ නිසා ඔහු උස් බිමෙහි ඉතිරි අඩ වැසි ජලය යටතේ වගා කිරීමට සැලසුම් කරයි. මිරිස් සඳහා පැළ ඝනත්වය, වාරි ජලය යටතේ හා වැසි ජලය යටතේ පිළිවෙළින් හෙක්ටයාරයට 37 000 හා හෙක්ටයාරයට 74 000 වේ.

(1) කොපමණ මිරිස් පැළ ප්‍රමාණයක්,

I වාරි ජල පහසුකම් ඇති ක්ෂේත්‍රයේ තිබිය යුතු ද?

....

....

II වැසි ජලය යටතේ ඇති ක්ෂේත්‍රයේ තිබිය යුතු ද?

....

....

(2) මිරිස්වල බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය 90% නම් ඔහුගේ උස් බිම සඳහා අවශ්‍ය වන මුළු බීජ ප්‍රමාණය කොපමණ ද?

....

....

....

(3) සාපේක්ෂ වශයෙන් වර්ෂා ජලය යටතේ අවශ්‍ය පැළ ඝනත්වය, වාරි ජලය යටතේ එම අවශ්‍යතාවට වඩා වැඩි වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

I ....

....

II ....

....

(4) උස් බිම් වගාවේ දී ද්විතීයික බිම් සැකසීම සඳහා යොදාගන්නා උපකරණ දෙකක් නම් කරන්න.

I ....

II ....

(5) මෙම මිරිස් ක්ෂේත්‍රය සඳහා යෝග්‍ය වාරි ක්‍රමයක් නිර්දේශ කරන්න.

....

(6) ඔබගේ නිර්දේශය සඳහා හේතු දෙකක් සඳහන් කරන්න.

I ....

II ....

(ii) ගොවියාට ඔහුගේ පහත් බිමෙහි මාස $3\frac{1}{2}$ වී වර්ගයක් වගා කිරීමට අවශ්‍ය වේ.

(1) බිම් සැකසීම සඳහා වසරේ වඩාත් ම උචිත කාලය කුමක් ද?

....

(2) මාස $3\frac{1}{2}$ වී වර්ගයක් නම් කරන්න.

....

(3) වී වගා ක්ෂේත්‍රයෙහි ජලය බැඳ තැබීමෙන් ඇතිවන වාසි හා අවාසි දෙක බැගින් සඳහන් කරන්න.

වාසි

I ....

II ....

අවාසි

I ....

II ....

(4) වියළි කලාපයේ වී වගාවේ දී වාරි ජලය ඉතිරි කරගත හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

I ....

II ....

2. (*a*) ශ්‍රී ලංකාවේ බීජ සහතික කිරීමේ සේවයක් ඇත.

(i) බීජ සහතික කිරීමේ සේවාවේ ප්‍රධාන පරමාර්ථය කුමක් ද?

....

....

(ii) ශ්‍රී ලංකාවේ වී ගොවීන්, සහතික කළ බීජ භාවිත කිරීම ඉතා සීමිතය. සහතික කළ බිත්තර වී ශ්‍රී ලංකාවේ වී ගොවීන් අතර ජනප්‍රිය නොවීමට හේතු තුනක් සඳහන් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(iii) ශ්‍රී ලංකාවේ බීජ සහතික කිරීමේ සේවාවේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ කොහේ ද?

....

(iv) බීජ සහතික කිරීමේ ක්‍රියාවලියේ දී ප්‍රධාන ආකාර දෙකක බීජ පරීක්ෂණ සිදුවේ. එනම් ක්ෂේත්‍ර පරීක්ෂණ හා විද්‍යාගාර පරීක්ෂණ වශයෙනි.

(1) ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී සලකා බැලෙන එක් ප්‍රධාන පරාමිතියක් නම් කරන්න.

....

(2) බීජ සහතික කිරීමේ විද්‍යාගාරයේ දී කෙරෙන පරීක්ෂණයේ දී සලකා බැලෙන පරාමිති තුනක් නම් කරන්න.

I ....

II ....

III ....

www.apepanthiya.lk

(v) පහත සඳහන් බීජ කාණ්ඩ සඳහා නිර්දේශිත ලේබල් වර්ණය සඳහන් කරන්න.

බීජ කාණ්ඩය		නිර්දේශිත ලේබල් වර්ණය
(1)	අභිජනන බීජ	....
(2)	අත්තිවාරම් බීජ	....
(3)	ලියාපදිංචි බීජ	....
(4)	සහතික කළ බීජ	....

(b) වාණිජ මට්ටමේ කැපූ මල් වගාකරුවන් අතර ක්ෂුද්‍ර ප්‍රචාරණය ජනප්‍රිය වී ඇත.

(i) ක්ෂුද්‍ර ප්‍රචාරණයෙහි මූලික මූලධර්මය කුමක් ද?

....

....

(ii) ක්ෂුද්‍ර ප්‍රචාරණයෙහි වාසි තුනක් සඳහන් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(iii) යැපුම් ගොවීන් අතර ක්ෂුද්‍ර ප්‍රචාරණය ජනප්‍රිය නොවීමට හේතු දෙකක් සඳහන් කරන්න.

(1) ....

(2) ....

(c) ගොවියකු සතු හෙක්ටයාර 5 ක් වූ කුඹුර අනෙකුත් වී වගාවලින් විසංගමනය වී ඇති අතර එය රබර් වගාවකින් වට වී පවතී. කෘෂි උපදේශකවරයකුගේ උපදේශය වන්නේ එම භූමිය කාබනික ගොවිතැනෙහි යොදගැනෙන ක්‍රම භාවිත කර වගා කරන ලෙස ය.

(i) කෘෂි උපදේශකවරයාගේ උපදේශයට පාදක වූ හේතු තුනක් සඳහන් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(ii) මෙම භූමිය සඳහා යෝග්‍ය රසායනික නොවන පළිබෝධ මර්දන ක්‍රම තුනක් ලැයිස්තු ගත කරන්න.

(1) ....

(2) ....

(3) ....

3. (a) පහත සඳහන් රූප සටහන ආධාරයෙන් අංක (i) හා (ii) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



www.apepanthiya.lk

(i) ඉහත රූප සටහනේ *J* සිට *N* තෙක් ඇති කොටස් නම් කර, එම කොටස්වලින් කෙරෙන ප්‍රධාන කාර්යය සඳහන් කරන්න.

	කොටසේ නම	ප්‍රධාන කාර්යය
(1)	*J*	....
(2)	*K*	....
(3)	*L*	....
(4)	*M*	....
(5)	*N*	....

(ii) කුකුළාගේ ආහාර ජීර්ණ පද්ධතිය තුළ දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ තුනක් ලැයිස්තුගත කරන්න.

(1) ....

(2) ....

(3) ....

(*b*) ගොවිපොළ සතුන්ගෙන් මිනිසාට සම්ප්‍රේෂණය විය හැකි රෝග දෙකක් නම් කරන්න.

(i) ....

(ii) ....

(*c*) පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් (i) ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.



www.apepanthiya.lk

(i) ඉහත රූප සටහනේ *P* සිට *T* තෙක් ඇති කොටස් නම් කර, එම කොටස්වලින් කෙරෙන ප්‍රධාන කාර්යය සඳහන් කරන්න.

	කොටසේ නම	ප්‍රධාන කාර්යය
(1)	*P*	....
(2)	*Q*	....
(3)	*R*	....
(4)	*S*	....
(5)	*T*	....

4. (*a*) ධාන්‍ය මගින් ප්‍රධාන පෝෂක සපයමින්, ශරීරයට අවශ්‍ය ශක්තිය ලබාදෙමින් යහපත් සෞඛ්‍යය පවත්වා ගැනේ.

(i) ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් පාරිභෝජනය වන ධාන්‍ය වර්ග තුනක් නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(ii) ධාන්‍ය මගින් ලබාදෙන ප්‍රධාන පෝෂක තුනක් ලැයිස්තුගත කරන්න.

(1) ....

(2) ....

(3) ....

(iii) ධාන්‍ය වර්ගවල බොහෝවිට ඌන ඇමයිනෝ අම්ලය නම් කරන්න.

....

(*b*) (i) හේන් ගොවිතැන පුරාණ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ අනුගමනය කළ කෘෂිකාර්මික ක්‍රමවේදයකි.

(1) පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් හේන් ගොවිතැනෙහි ඇති ප්‍රධාන අවාසි තුනක් ලැයිස්තුගත කරන්න.

I ....

II ....

III ....

(2) හේන් ගොවිතැනෙහි ප්‍රධාන අංගයක් වන්නේ මිශ්‍ර වගාවයි. මිශ්‍ර වගාවෙහි ඇති ප්‍රධාන වාසි තුනක් සඳහන් කරන්න.

I ....

II ....

III ....

(ii) පහත සඳහන් දෑ අර්ථ දක්වන්න.

(1) වියළි ගොවිතැන

....

(2) සංරක්ෂණ ගොවිතැන

....

(3) ඒකාබද්ධ ගොවිතැන

....

(iii) බෝග මාරුවෙහි ඇති වාසි දෙකක් සඳහන් කරන්න.

(1) ....

(2) ....

www.apepanthiya.lk

(*c*) (i) ආදායම් ඉල්ලුම් නම්‍යතාව අර්ථ දක්වන්න.

....

(ii) පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් X නමැති භාණ්ඩයේ ඉල්ලුම් වක්‍ර (D_1 හා D_2) දක්වයි.



D_1 සිට D_2 දක්වා ඉල්ලුම් වක්‍රය විතැන් වීමට බලපාන කරුණු දෙකක් ලැයිස්තු ගත කරන්න.

(1) ....

(2) ....

(*d*) පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් අංක (i) සිට (iv) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



ආදායම විචලනයවීමක දී *A*, *B*, *C* හා *D* යන කලාපවලට අදාළව පාරිභෝගිකයකු X භාණ්ඩය මිලදී ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(i) *A* කලාපය

....

....

....

(ii) *B* කලාපය

....

....

....

(iii) *C* කලාපය

....

....

....

(iv) *D* කලාපය

....

....

....

www.apepanthiya.lk

* * *

B කොටස - රචනා

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 15 කි.)

---

1. (a) ශ්‍රී ලංකාවේ ඊසාන දිග හා නිරිත දිග මෝසම් ඇතිවීමට බලපාන සාධක පිළිබඳ ව සටහන් ලියන්න.
   (b) පාංශු ජනනය කෙරෙහි පාංශු ජනන සාධකවල බලපෑම විස්තර කරන්න.
   (c) පැසවීම මගින් ආහාර සැකසීමේ මූලික සිද්ධාන්තය විස්තර කරන්න.

2. (a) බීජ වප්කරයක ක්‍රියාකාරිත්වය පැහැදිලිව නම් කළ රූප සටහනක් භාවිතයෙන් පැහැදිලි කරන්න.
   (b) උදහරණ දක්වමින්, සත්ත්ව ආහාරවල සම්පූර්ණ වර්ගීකරණය ලියන්න.
   (c) ප්‍රවේණික සම්පත් සංරක්ෂණයේ වැදගත්කම විස්තර කරන්න.

3. (a) කෘෂිකාර්මික භාවිතයේ දී කේන්ද්‍රාපසාරී පොම්ප අනෙකුත් පොම්ප ආකාරවලට වඩා ජනප්‍රිය මන්දැයි පැහැදිලි කරන්න.
   (b) "උපේක්ෂා වක්‍ර න්‍යාය මගින් පාරිභෝගික රුචිය පැහැදිලි කළ හැකි ය." මෙම ප්‍රකාශය විස්තර කරන්න.
   (c) එළදෙනකගෙන් කිරි දෙවීමේ සෞඛ්‍ය විද්‍යාත්මකව නිවැරදි ක්‍රමය විස්තර කරන්න.

4. (a) ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශයේ බෑවුම් ලෙස හායනයට ලක් වූ ඉඩම් සඳහා යොදා ගත හැකි පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම කවරේ ද?
   (b) ඔබගේ පාසල් විද්‍යාගාරයේ දී වී බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය මනින්නේ කෙසේදැයි විස්තර කරන්න.
   (c) බහුවාර්ෂික වල් පැළෑටියක් යනු කුමක් ද? බහුවාර්ෂික වල් පැළෑටි සාර්ථකව පාලනය කළ හැකි ක්‍රම විස්තර කරන්න.

5. (a) දේශීයව සපයා ගත හැකි අමුද්‍රව්‍ය ඇසුරෙන් තාවකාලික ප්‍රචාරක ව්‍යුහයක් සාදා ගන්නා ආකාරය හා අතු කැබලිවල මුල් අද්දවා ගැනීම සඳහා එය භාවිත කරන ආකාරය විස්තර කරන්න.
   (b) පැහැදිලිව නම් කළ රූප සටහන් යොදා ගනිමින් පහත දැක්වෙන ප්‍රචාරණ ක්‍රම පැහැදිලි කරන්න.
      (i) වායව අතු බැඳීම
      (ii) භූමි අතු බැඳීම
      (iii) අංකුර බද්ධය
      (iv) රිකිලි බද්ධය
   (c) ආහාර සුරක්ෂිතතාව යනු කුමක් ද? එය සහතික කර ගැනීමට රටකට අනුගමනය කළ හැකි ක්‍රම පැහැදිලි කරන්න.

6. (a) ගොවියකු විසින් අනුගමනය කළ යුතු වූ, ගොවිපොළ සතුන්ගේ රෝග වළක්වා ගන්නා ක්‍රම පැහැදිලි කරන්න.
   (b) ශාකවල උත්ස්වේදනය නිරීක්ෂණය කිරීම සඳහා සිදුකළ යුතු පරීක්ෂණයක පියවර විස්තර කරන්න.
   (c) ශ්‍රී ලංකාවේ පලතුරුවල හා එළවලුවල පසු අස්වනු හානි අවම කර ගැනීම සඳහා උචිත ක්‍රම විස්තර කරන්න.

www.apepanthiya.lk

* * *